**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) -2013**

---

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) ණය ගිවිසුමට අනුව , පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් හතේ පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ගිණුම් කටයුතු භාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත්වූ පළාත් පාලන ආයතන මගින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 68.8 ක් වූ අතර එයින් එජඩො මිලියන 59 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. 2012 ජූලි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මුල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් , ණය වලින් කරන ලද මිලදී ගැනීම් හදුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමහ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

**---------**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුම් ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

## 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 321,601,820 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 337,373,655 ක් විය. ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2012 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ හා උපකරණ | 140,721,981 | - | 140,721,981 |
| උපදේශක සේවා | 89,558,874 | 7,293,093 | 96,851,967 |
| දේපළ පිරියත හා උපකරණ | 574,948 | 73,095 | 648,043 |
| පොලී | 960,887 | 236,287 | 1,197,174 |
| මෙහෙයුම් පිරිවැය | 89,785,130 | 8,169,360 | 97,954,490 |
| එකතුව | 321,601,820 | 15,771,835 | 337,373,655 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 120,848.56 | 15,367,200 |
| එකතුකළා :- ඌනපූර්ණයන් | 2,900,818.80 | 379,746,568 |
| ප්‍රත්‍යාගණන වාසිය | - | 470,855 |
| | 3,021,667.36 | 395,584,623 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 1,768,532.17 | 231,733,437 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,253,135.19 | 163,851,186 |

## 5. විගණන නිරීක්ෂණ

--------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

ව්‍යාපෘති පරිපාලන අත්පොතේ 5(ඇ) ඡේදය අනුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස 9 ක් තුල ණය දෙන නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ව්‍යාපෘතිය සංවිධානය කර ඇති අකාරය අනුව, ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ගිණුම්කරණ හා පරිපාලන කාර්යයන් සඳහා වෙන්වූ වාර්තා නඩත්තු කිරීම පළාත් හතෙහි පිහිටුවා ඇති උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකවල වගකීම වේ. කෙසේ වුවද මූල්‍ය හා අනෙකුත් වත්කම් හා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය දරන ලද වියදම් හඳුනා ගැනීම සඳහා සමහර උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකක ප්‍රමාණවත් ලෙස වාර්තා පවත්වාගෙන නොගිය අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i). වයඹ පළාත් උප ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 424,647 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ii). පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය භාවිතා කළ වටිනාකම රු. 87,111,839 ක්වූ මෙම ව්‍යාපෘතියට පවරන ලද දේපළ පිරියත හා උපකරණ 2013 දෙසැම්බර් 31 දින වන විටද ගිණුම් ගත කර නොතිබුණි.

### 5.3 නීතී,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 756 අනුව ව්‍යාපෘතියට අයත් රු.87,759,882 ක් වූ වත්කම් වල භෞතික පැවැත්ම නිශ්චය කර ගැනීම සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(අ) අනුව අත්තිකාරම ලබා ගත් කාර්යය සම්පූර්ණ වූ වහාම අත්තිකාරම පියවීම කළ යුතු වේ. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මෙහෙයුම් ඒකකය වෙත අනුයුක්ත කර ඇති ව්‍යාපෘතියේ නිළධාරීන් අවස්ථා 32 කදී ලබා ගෙන ඇති එකතුව රු.660,837 ක අත්තිකාරම් දින 27 සිට 345 දක්වා වූ ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. තවද, වෙනත් නිළධාරීන් 4 දෙනෙකු අවස්ථා 28 කදී ඊට පෙර ලබා ගත් අත්තිකාරම් පියවීමකින් තොරව යළිත් අත්තිකාරම් ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---------------------------------

### 6.1 අරමුදල් උපයෝජනය

----------------------

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මුල්‍යනය සඳහා එකඟ වු මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | |
| ආසබැ | 59.00 | 6,490 | 475 | 340 | 3.69 | 368 | 6.25 |
| ශ්‍රීලංර | 9.77 | 1,075 | 75 | 67 | 0.70 | 71 | 7.16 |
| එකතුව | 68.77 | 7,565 | 550 | 407 | 4.39 | 439 | 6.7 |

වැඩ ආරම්භ කිරීමේ  අත්තිකාරම් ඇතුලත් වීම නිසා ව්‍යාපෘතියේ 4.1 ඡේදයේ දැක්වෙන අගයන් මෙම සංඛ්‍යා සමඟ එකග නොවේ.

## 6.2 භෞතික ප්රගතිය

ව්‍යාපෘතියේ ප්‍රාරම්භක තාක්ෂණික සහය වාර්තාවේ සාමාන්‍ය කොන්දේසි අනුව, ප්‍රාදේශීය සභා 176 ක් සඳහා ඔවුන්ගේ පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීමට රු.මිලියන 50 බැගින් වෙන් කිරීමට ව්‍යාපෘතිය එකඟ වී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද සිවිල් වැඩ වල ප්‍රගතිය පහත දැක්වේ.

| පළාත | වෙන්කරන ලද මුදල | වෙන්කරන ලද උප ව්‍යාපෘති ගණන | 2014 ඔක්තෝබර් 30 දිනට සිවිල් වැඩ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | නිම කල යුතු ඉදිකිරීම් වැඩ | නිම කරන ලද ඉදිකිරීම් වැඩ | ආරම්භ නොකරන ලද ඉදිකිරීම් වැඩ |
| උතුරු මැද | 650 | 28 | 19 | 02 | 07 |
| මධ්‍යම | 900 | 28 | 15 | 01 | 12 |
| සබරගමුව | 800 | 25 | 12 | - | 13 |
| වයඹ | 650 | 21 | 14 | 01 | 06 |
| ඌව | 800 | 27 | 13 | 02 | 12 |
| දකුණ | 1,100 | 29 | 16 | 01 | 12 |
| බස්නාහිර | 500 | 18 | 09 | - | 09 |
| | 5,400 | 176 | 98 | 07 | 71 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට සැලසුම්කර තිබුණද 2014 ඔක්තෝබර් 30 දිනට ප්‍රාදේශීය සභා සඳහා පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 7 ක් පමණක් විය.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවුරුදු 1 ½ ක කාලයක් ගතවී තිබුණද පරිපාලන ගොඩනැගිලි 176 අතරින් 71 ක ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව නිරීක්ෂණය විය. සිවිල් ඉදිකිරීම් වැඩ වල ප්‍රගතිය ඉතා අඩු බව මෙයින් පැහැදිලි වේ.

**6.3 වත්කම් අව භාවිතය**

**----------------------**

2013 සැප්තැම්බර් 11 දින දකුණු පළාතේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව භාර දී තිබූ රු.3,450,574 ක වටිනාකමකින් යුත් ට්‍රක් රථය කුලී පදනම මත බාහිර පාර්ශව වෙත භාවිතය සඳහා ඉඩ දී තිබුණි.